මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
P.O. Box 114, No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk* e-mail: *psc.cp.gov@gmail.com*

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213096, 081-2213082 |

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/6/ 6 (2021)
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2021.10. 18

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක නිලධාරීන් සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020/2021**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2015.04.30 දිනැතිව අනුමත කර ඇති 'මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය'ට අනුකූලව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක නිලධාරීන් සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020/2021 සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. විභාග මධ්‍යස්ථානය :- මහනුවරදී පමණක් පවත්වනු ලැබේ.
2. අයදුම්පත් :- විභාග සඳහා ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන විභාග අපේක්ෂකයින් මෙම ලිපියෙහි අවසානයට දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය අනුව තම තමන්ගේ අයදුම්පත්‍ර A4 ප්‍රමාණයේ කඩදාසියෙහි දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස්කර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු බැවින්, නියමිත දිනට ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි අයදුම්කරුවන් කල්වේලා ඇතිව තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතුය.
3. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021.11.03 වන දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර." යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නම සඳහන් කිරීම වැදගත්ය.
   a. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.
   b. කිසිදු ලියවිල්ලක් හෝ සහතිකයක් අයදුම්පත්‍රයට ඇමිණිය යුතු නොවේ.
   c. පහත දැක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
      i. අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ අන් කිසි අන්දමින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම්පත්.
      ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත්.
4. විභාග ගාස්තු :- මෙම විභාගය සඳහා පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඉන්පසු ඉදිරිපත්වන සෑම අවස්ථාවකමදීම විභාග ගාස්තු වශයෙන් එක්

විෂයයක් සඳහා රු 300/= ක මුදලක්ද විෂයන් දෙකක් සඳහා රු: 400/= ක මුදලක්ද මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ **20.03.02.13** ආදායම් ශීර්ෂයට බැර වනසේ මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. අදාල මුදල් කුවිතාන්සිය (නිල් පැහැති කුවිතාන්සිය) අයදුම්පත්‍රයේ නියමිත කොටසේ නොගැලවෙනසේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බවද කාරුණිකව දන්වමි.

5. භාෂා මාධ්‍යය :- මෙම විභාග සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවෙකු ඉදිරිපත්වන විෂයයන් සියල්ලම සඳහා එක් භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, කිසිදු හේතුවක් නිසාවත් විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6. ප්‍රවේශ පත්‍ර :- විභාගය ආරම්භ කිරීමට දින 14 කට පෙර අයදුම්පත්‍රවල දක්වා ඇති රාජකාරි ලිපිනයන්ට ප්‍රවේශ පත්‍ර තැපැල් කර එවනු ලැබේ. යම් හෙයකින් අපේක්ෂකයන්ට ලිඛිත පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍රයක් නොලැබුණහොත්, ඔහු විසින් හෝ ආයතන ප්‍රධානියා විසින් ඒ බව නොපමාව පහත දැක්වෙන තොරතුරු සපයමින් මා වෙත වාර්තා කළයුතුය.
(ෆැක්ස් - 081 2213082)

    a. විභාගයේ නම.
    b. අයදුම්කරුගේ සම්පූර්ණ නම.
    c. ලිපිනය.
    d. ආයතන ප්‍රධානියා අයදුම්පත්‍රය තැපැල් කළ දිනය, ලියාපදිංචි කළ අංකය සහ තැපැල් කාර්යාලය.

7. අනන්‍යතා පත්‍ර :- මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයකදීම විභාග ශාලාධිපති සෑහීමකට පවතින අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක් ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

    a. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රයක්
    b. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

8. ප්‍රතිඵල :- මෙම විභාගයට අයත් ප්‍රතිඵල අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කළ ආයතන ප්‍රධානියා වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

9. විෂය නිර්දේශය ඇමුණුම 01 යටතේ ද, ආදර්ශ අයදුම්පත්‍රය ඇමුණුම 02 යටතේද දක්වා ඇත.

10. උක්ත විභාගය සම්බන්ධයෙන් මෙම ලිපියෙහි සඳහන් නොවූ කිසියම් කරුණක් වෙතොත් එය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

11. කරුණාකර මෙම ලිපියෙහි අඩංගු කරුණු ඔබ ආයතනයට අයත් අදාල සියලුම මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ටී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

ඇමුණුම 01

<u>**විෂය නිර්දේශය**</u>

**විෂය 01 - කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය කාලය පැය 02 (ලකුණු 100)**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ පහත දැක්වෙන පරිච්ඡේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ආයතන සංග්‍රහ විධිවිධාන, කාර්යාල පරිචය හා කාර්යාල ක්‍රම පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.

| | |
|---|---|
| Vවන පරිච්ඡේදය- | මුදාහැරීම්, නැවත සේවයට ගැනීම් සහ සේවය අවසන් කිරීම |
| VIIIවන පරිච්ඡේදය - | අතිකාල දීමනා, නිවාඩු දවස්, නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XIIවන පරිච්ඡේදය - | නිවාඩු |
| XIIIවන පරිච්ඡේදය - | දුම්රිය බලපත්‍ර |
| XIVවන පරිච්ඡේදය - | දිවයින තුල රාජකාරි ගමන් |
| XIXවන පරිච්ඡේදය - | රජයේ නිවාස |
| XLVIIවන පරිච්ඡේදය- | සාමාන්‍ය හැසිරීම හා විනය |

**විෂය 02 - මුදල් රෙගුලාසි කාලය පැය 02 (ලකුණු 100)**

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

| | |
|---|---|
| 1 වන පරිච්ඡේදය - | වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>ඒකාබද්ධ අරමුදල වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු.රෙ. 1 සිට 68 දක්වා) |
| 111 වන පරිච්ඡේදය - | මූල්‍ය කළමණාකරණය හා උත්තරදායි බව ප්‍රධාන ගණක නිලධාරින්, ගණක නිලධාරින්, ආදායම් ගිණුම් නිලධාරින් ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු.රෙ. 124 සිට 147 දක්වා) |

- \- එක් එක් විෂයය සමත්වීමේ අවම ලකුණු ගණන 40%ක් වේ.

ඇමුණුම 02 - ආදර්ශ අයදුම්පත්‍රය

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර -</u>
<u>තාක්ෂණ ඛණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක නිලධාරීන් සඳහා වන</u>
<u>1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020/2021</u>

විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය:-

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

(අදාළ කොටුවේ " √ " සළකුණ යොදන්න.)

විභාග අංකය:- [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

---

**01.** අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුව/ආයතනය: ..................................................
..............................................................................................................................................

**02.** i. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්):- .......................................................
..............................................................................................................................................

ii. මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසියෙන්):- ..........................................................................
..............................................................................................................................................

iii. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්):- ..........................................
..............................................................................................................................................

iv. මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්):- .........................................................
..............................................................................................................................................

v. ජාතික හැඳුනුම්පත් අංකය:- [ | | | | | | | | | | | ]

**03.** i. කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසියෙන් - ප්‍රවේශපත්‍ර එවීම සඳහා):- .................................................
..............................................................................................................................................

ii. පෞද්ගලික ලිපිනය :- ..........................................................................................................
..............................................................................................................................................

iii. දුරකතන අංකය :- කාර්යාලය: ............................. පෞද්ගලික: .................................

**04.** සේවා විස්තර:-

i. දැනට දරණ තනතුර:- ...................................................................
ii. පන්තිය හා ශ්‍රේණිය:- ...................................................................
iii. මුල් පත්වීම් ලිපියේ අංකය:- ............................................................ දිනය:- .........................
iv. වැටුප් ඛණ්ඩය:- .........................................

**05.** i. මෙම විභාගයේදී පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන්:-

| | විෂය | විෂය අංකය |
|---|---|---|
| 1. | ........................................................................................................ | .................... |
| 2. | ........................................................................................................ | .................... |

ii. මෙම විභාගය සඳහා පෙනී සිටිනු ලබන වාරය:- ........................

**06.** විභාග ගාස්තු:-

| |
|---|
| <u>*නිල් පැහැති*</u> මුදල් කුවිතාන්සිය මෙහි අලවන්න. |

i. මෙම අයැදුම්පතේ මවිසින් දක්වන ලද සියළුම විස්තර මාගේ දැනුමේ පමණින් සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි

ii. මම විභාග ගාස්තු වශයෙන් රු. .................... ක මුදලක් ............................. වන දින ................................... කාර්යාලයට ගෙවූ බවත් ඊට අදාළ .......................... අංක දරණ කුවිතාන්සිය මෙහි අලවා ඇති බවත් සඳහන් කරමි.

iii. මම මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබූවකු නොවන බව විභාගයට පෙර හෝ ඉන් පසුව හෝ අනාවරණය වුවහොත් කොමිෂන් සභා ලේකම්වරයාට මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඇති අයිතිය හා බලය අවිවාදයෙන් පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට මම එකඟ වෙමි.

.................................... ................................................

දිනය අයැදුම්කරුගේ අත්සන

<u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>

ඉහත සඳහන් ........................................................ නම් නිලධාරියා විසින් මෙම අයැදුම්පතේ අංක 02, 03, 04, 05 සහ 06 යන ඡේද වල දක්වා ඇති විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත්, අයැදුම්කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති නියමිත විභාගය සඳහා අයැදුම් කර ඇති බවත්, මෙම විභාගයට අදාළ කොන්දේසි හා ව්‍යවස්ථා යටතේ මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි.

.......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ආයතනය:- ......................................................................

දිනය:- ...........................................